**ශ්‍රී ලංකා සර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම - 2023**

**-------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා සර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

[

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5. ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ සිට පැවත එන ඉන්ෆොමේෂන් කොමියුනිකේෂන් ටෙක්නොලොජි ඒජන්සි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමෙන් ලැබිය යුතු රු.40,215,928 ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | මෙම ගිණුම් ශේෂය සම්බන්ධයෙන් පරික්ෂා කිරීමට කමිටුවක් තාක්ෂණ අමාත්‍යාංශය විසින් පත්කර ඇති අතර කමිටු නිර්දේශ මත පදනම්ව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | ලැබියයුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළයුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) 2021 නොවැම්බර් 16 දිනැති අංක: 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති මාර්ගෝපදේශය හි 2.3 වගන්තිය | මාර්ගෝපදේශය ප්‍රකාරව වාර්ෂික අයවැය, ක්‍රියාකාරී සැලැස්ම සමග වසර පහක් සඳහා වූ උපායමාර්ග සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් සමාගම ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂය සඳහා වාර්ෂික අයවැය සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. තවද, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඉදිරිපත් කර ඇත .සමාගම සඳහා පිළියෙළ කළ යුතු වසර 5ක් සඳහා වූ උපාය මාර්ග සැලැස්ම 2023 වර්ෂයේදී පිළියෙළ කර නොතිබුණි. | මාර්ගෝපදේශය ප්‍රකාරව වාර්ෂික අයවැය ,ක්‍රියාකාරී සැලැස්ම හා උපායමාර්ග සැලැස්ම පිළියෙල කළ යුතුය. |
| ආ) 2021 නොවැම්බර් 16 දිනැති අංක: 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති මෙහෙයුම් අත්පොත | | | . |
| i) 3.2 ඡේදය | සමාගම සඳහා අනුමත බඳවාගැනීමේ පරිපාටියක් හා අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාවක් නොතිබුණි. | එකඟ වෙමි. ආයතනයට අදාළ බඳවා ගැනීමේ සහ උසස් කිරීම් පරිපාටිය මේ වන විට පිළියෙළ කෙරෙමින් පවතී. | මෙහෙයුම් අත්පොත ප්‍රකාරව සමාගම සඳහා බඳවාගැනීමේ පටිපාටියක් හා කාර්ය මණ්ඩල සංඛ්‍යාවක් අනුමත කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| ii) 3.4 ඡේදය | සෑම රජය සතු ව්‍යාපාරයකටම කාර්ය මණ්ඩල අනුප්‍රාප්තික සැලැස්මක් (Succession Plan) තිබිය යුතු වුවද සමාගම අනුප්‍රාප්තික සැලැස්මක් පිළියෙලකර නොතිබුණි. | . මෙතෙක් සමාගම කාර්ය මණ්ඩල අනුප්‍රාප්තික සැලැස්මක් (Succession Plan) පිළියෙළ කර නැත. එහෙත් බඳවා ගැනීමේ පරිපාටිය (SOR) සකස් කිරීමත් සමගම අදාළ අනුප්‍රාප්තික සැලැස්ම බඳවා ගැනීමේ පරිපාටියෙන් ගම්‍ය වන පරිදි පිළියෙළ කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙහෙයුම් අත්පොත ප්‍රකාරව කාර්ය මණ්ඩල අනුප්‍රාප්තික සැලැස්මක් පිළියෙල කළ යුතුය. |
| iii) 4.3 ඡේදයහි iii උප වගන්තිය | ලැබීම් සහ නිකුත්කිරීම් යන දෙකෙහිම කළමනාකරණය සඳහා විධිමත් ඉන්වෙන්ට්‍රි පද්ධතියක් පවතින බව සමාගම සහතික විය යුතු නමුත් ඉන්වෙන්ට්‍රි සම්බන්ධයෙන් පද්ධතියක් හඳුන්වාදී නොතිබුණි. | එකඟ වෙමි. සමාගමේ ඉන්වෙන්ට්‍රි සම්බන්ධයෙන් බඩු වට්ටෝරු පොතක් පවත්වා ගෙන යාමට 2024 වසරේ සිට කටයුතු ආරම්භ කර ඇත. | මෙහෙයුම් අත්පොත ප්‍රකාරව විධිමත් පද්ධතියක් හඳුන්වා දිය යුතුය. |
| iv) 6.1.ඡේදයහි ii උප වගන්තිය | ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහතික කරනු ලැබීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කළමනාකරණය වෙත මූල්‍ය අධිකාරිය පැවරිය යුතු වුවත් සමාගම ඒ අනුව කටයුතුකර නොතිබුණි. | එකඟ වෙමි. 2024 වර්ෂයට සකස් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කළමණාකරනයට මූල්‍ය බලතල පැවරිය. | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කළමනාකරණය වෙත මූල්‍ය අධිකාරිය පැවැරිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 21,678,519 ක බදු පසු අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.7,902,861 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 13,775,658ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සයිබර් ආරක්ෂණ සේවා සැපයීම තුලින් ඉපැයු ආදායම රු. 14,136,763 කින් එනම් සියයට 153කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම සඳහා අනුමත බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් නොමැති වුවද 2013 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධක්ෂක මණ්ඩල අනුමැතිය මත කාර්ය මණ්ඩලයට, කාර්යසාධන ඇගයීමකට පසු සියයට 5 සිට සියයට 13 දක්වා වැටුප් වැඩිකිරීම් ලබා දී තිබුණි. තවද සමාගමේ සියලුම කාර්යමණ්ඩලය කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ අතර ඉන් දෙදෙනෙක් සඳහා උසස්වීම් 2023 අගෝස්තු 01 දින අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කර තිබුණි. | ශ්‍රී ලංකා සර්ට් ආයතනය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අත්පොත ප්‍රකාරව, “Annexure A” යටතේ පවතින ආයතනයක් බැවින්, අධ්‍යක්ෂ මණ්ඩලයට ආයතනයේ සංවිධාන ව්‍යුහය තීරණය කිරීමට, බඳවා ගැනීම් හා උසස් කිරීම් පිළිබඳ කටයුතු කිරීමට සහ වැටුප් තීරණය කිරීමට බලතල ඇත. | කොන්ත්‍රාත් පදනම මත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේදී සේවා කාලය, ගෙවනු ලබන පාරිශ්‍රමිකය පූර්වයෙන් දක්වන බැවින් මෙහෙයුම් අත්පොත ප්‍රකාරව බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටිය සඳහා නිසි අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම 2023 වර්ෂය සඳහා රු.1,977,653 ක් වැයකර භාණ්ඩාගාර/ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩලයට සෞඛ්‍ය වෛද්‍ය රක්ෂණාවරණයක් ලබා දී තිබුණි. තවද එක් නිලධාරියකුට රු. 2,500 බැගින් සෞඛ්‍ය වෛද්‍ය දීමනාවක් හා රු. 15,000 ක් බැගින් ගමන් වියදම් දීමනාවක් ගෙවා තිබුණ ද ඒ සඳහා ද භාණ්ඩාගාර/ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ශ්‍රී ලංකා සර්ට් ආයතනය 2018 දී ICTA ආයතනයෙන් ස්වාධීනව කටයුතු කරන ආයතනයක් බවට පත් කරන ලදී. ඒ අනුව මාසිකව ගමන් වියදම් දීමනාව සහ සෞඛ්‍ය වෛද්‍ය දීමනාව යන දීමනා ලබා දෙනු ලබන අතර එය උපයන විට ගෙවීම් බද්දට ද යටත් වේ.<br><br>ශ්‍රී ලංකා සර්ට් ආයතනය එහි සේවකයින් සඳහා ලබා දෙන සෞඛ්‍ය වෛද්‍ය රක්ෂණාවරණය අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශ යටතේ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා තාක්ෂණ අමාත්‍යාංශය මගින් යොමු කොට ඇත. | සියළු ගෙවීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල හා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත්ව නොතිබුණු මූල්‍ය කළමනාකරු සහ නීති හා නියාමන කටයුතු කළමනාකරු යන තනතුරු දෙක සඳහා නිලධාරීන් දෙදෙනෙකු බඳවාගෙන පිළිවෙලින් වැටුප් හා දීමනා ලෙස රු.2,517,500 හා රු. 675,000 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | මූල්‍ය කළමණාකරුවෙකුගේ අවශ්‍යතාවය මතු වීම සමඟ 2022 නොවැම්බර් පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මූල්‍ය කළමනාකරු බඳවා සඳහා තීරණය කරන ලදී.අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව, නීති හා නියාමන කටයුතු කළමනාකරු බඳවා ගැනීම සඳහා වියදම් පාලන චක්‍රලේඛ වලට අනුගත වෙමින් නව බඳවා ගැනීම් සඳහා තාක්ෂණ අමාත්‍යාංශය හරහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවෙන් අනුමැතිය ඉල්ලීමට කටයුතු කරන ලදී. | බඳවා ගැනීමට ප්‍රථම තනතුරු අනුමත කරවාගත යුතුය. |